සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2023 (2024)**
**General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)**

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ......................................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.
  - **I කොටස**
    - ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
    - එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
  - **II කොටස**
    - අනුකොටස් තුනකින් සමන්විත ය.
    'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| I පත්‍රය සඳහා | |
| කොටස | ලකුණු |
| I | |
| II | |
| එකතුව | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |

## I කොටස

- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. අනුරාධපුර බිසෝ මාලිගයේ සඳකඩපහණ හා පොලොන්නරු වටදාගෙය සඳකඩපහණ සැලකීමේ දී දැකිය හැකි ආකෘතිමය වෙනස්වීම වනුයේ,
   (1) අර්ධ චන්ද්‍රාකාර හැඩය අභිබවා යාම ය.
   (2) සත්ත්වාවලියේ අනුක්‍රමිකතාව වෙනස්වීම ය.
   (3) සත්ත්ව රූප වෙන් වෙන් තීරුවල යෙදීම ය.
   (4) මධ්‍යයේ ඇති පද්මයේ ස්වරූපය වෙනස්වීම ය.
   (5) සිහින් තීරු වෙනුවට පළල් තීරු යොදා සැටයම් කිරීම ය. (.........)


2. වෙට්ටම්බුගල ගුහාවේ 'දළ දෙකක් සහිත ඇත් රුව' සිතුවම් කර ඇත්තේ,
   (1) අළු, කහ පැහැති වර්ණ තැවරීමෙනි.
   (2) සුදු, අළු පැහැති වර්ණ මිශ්‍ර කිරීමෙනි.
   (3) ජ්‍යාමිතික හැඩතල භාවිතයෙනි.
   (4) රතට හුරු කහ (දුඹුරු) පැහැය තැවරීමෙන්.
   (5) රේඛාවට මුල් තැන දී වර්ණ කිරීමෙනි. (.........)

3. පාර්වතී දෙවඟන මූර්තිය නිර්මාණයේ දී ශිල්පියා උත්සාහ දරා ඇත්තේ,
   (1) ලෝහ වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් දේවත්වය ප්‍රකාශ කිරීමට ය.
   (2) දිව්‍යමයබව දැක්වීමට උචිත පළඳනා, ආභරණ හා ලාලිත්‍යමය ඉරියව් ප්‍රකාශනයට ය.
   (3) ත්‍රිභංග ඉරියව්වෙන් ස්ත්‍රී ලාලිත්‍ය හා සමශරතාව දැක්වීමට ය.
   (4) දකුණු අතින් කටක හස්ත මුද්‍රාව හා වමතින් ගජ හස්ත මුද්‍රාව දැක්වීමට ය.
   (5) නාරි දේහයේ සුන්දරත්වය මතු කිරීමට වස්ත්‍රාභරණ ඇඟට ඇලුණු ස්වභාවයෙන් දැක්වීමට ය. (.........)

4. විචාරක මතය අනුව රාජා රවිවර්මාගේ සිතුවම්කරණයේ දැකිය හැකි දෘශ්‍ය භාෂාව වනුයේ,
   (1) ඇංග්ලෝ ඉන්දියානු සම්ප්‍රදායයි.
   (2) ඉන්දියානු හා පෙරදිග කලා ශෛලියයි.
   (3) උපස්ථිතිවාදී කලා භාෂාවේ ප්‍රයෝගයි.
   (4) ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ ලක්ෂණයි.
   (5) ඉන්දීය ස්වදේශීය කලා සම්ප්‍රදායේ ආභාසයයි. (.........)


5. ජුලියස් සීසර්ගේ උඩුකය මූර්තියෙන් ප්‍රකාශ වන්නේ,
   (1) කිරිගරුඬ මාධ්‍ය හැසිරවීමේ ඇති ශිල්පීය කෞශල්‍යයයි.
   (2) රෝම මූර්ති කලාවේ ඇති තාත්ත්විකවාදී ශිල්ප ක්‍රමයේ නැඹුරුවයි.
   (3) අධිරාජ්‍යයකු සතු ප්‍රතාපවත් හා තේජාන්විත ප්‍රකාශයයි.
   (4) සියුම් ලෙස මතුකළ අධිරාජ්‍යයාගේ අභ්‍යන්තර සංකීර්ණතාවයයි.
   (5) ස්වාභාවිකත්වයට උචිත මස් පිඬු, සම හා නහර මතුකර දැක්වීමේ කෞශල්‍යයයි. (.........)

● ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන පිළිතුරු** 1 සිට 9 තෙක් අංක කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


1


2


3


4


5


6


7


8


9

6. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී (Academic Realism) කලා ලක්ෂණ භාවිත සිතුවම් මොනවා ද?
   (1) 1,2,6  (2) 1,2,8  (3) 1,6,7  (4) 1,6,8  (5) 1,7,8 (.........)

7. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ දී තිබෙන කලාත්මක ගුණය මිශ්‍රිත සිතුවම කුමක් ද?
   (1) 2  (2) 4  (3) 5  (4) 7  (5) 8 (.........)

8. ඝණකවාදී කලා ප්‍රයෝග දැකිය හැකි සිතුවම් මොනවා ද?
   (1) 2, 3  (2) 2, 4  (3) 3, 5  (4) 3, 7  (5) 4, 9 (.........)

9. සංරචනයේ දී කොලාජ් ශිල්ප ක්‍රමය සමඟ මිශ්‍ර මාධ්‍ය භාවිත කළ සිතුවම කුමක් ද?
   (1) 2  (2) 3  (3) 4  (4) 7  (5) 9 (.........)

10. නූතනවාදී කලාවේ ප්‍රකෘතිමය තත්ත්වය හා ස්වාභාවිකත්වය විරූපණය (විකෘති කිරීම) කර දැක්වෙන නිර්මාණ මොනවා ද?
   (1) 2, 3  (2) 3, 5  (3) 4, 5  (4) 5, 7  (5) 7, 9 (.........)

● ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර A, B, C, D, E ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A




B



C



D



E

11. A රූපයේ දැක්වෙන නළඟන සිතුවමෙහි ඇති ආධ්‍යාත්මික ප්‍රකාශය තීව්‍ර කිරීමට ශිල්පියා උත්සාහ ගෙන ඇත්තේ,
   (1) අඩවන් දෙනෙතින් ශෝකානුකූල හා කල්පනාකාරීබව ප්‍රකාශ කිරීම මගිනි.
   (2) පසෙකට හැරී ඇති මුහුණට යොදා ඇති අඳුරු වර්ණමාලාව මගිනි.
   (3) ගැඹුරු කල්පනාකාරී ඉරියව් මෙන්ම ජීවය පිලිහුණු දෙනෙතිනි.
   (4) නර්තනයට සූදානම් වන අවස්ථාවට බාහිර අංගෝපාංග එක් කිරීමෙනි.
   (5) ශරීරය සඳහා දීප්තිමත් වර්ණ මෙන්ම පසුබිම සඳහා සංගත වර්ණමාලාවක් භාවිතයෙනි. (.........)

12. B රූපයේ දැක්වෙන අම්රිතා ශර්ගිල්ගේ 'ගැහැණු ළමුන් තිදෙනා' සිතුවමේ සංකේතාර්ථ මතු කරලීමට ශිල්පියා උත්සාහ දරා ඇත්තේ,
   (1) බිත්තියට වැටී ඇති අඳුරු පැහැ සෙවනැලි මගිනි.
   (2) මලානික අඳුරු කහ පැහැති පසුබිමක් යෙදීමෙනි.
   (3) අප්‍රිය විලාපයෙන් දැක්වෙන කාන්තා රූ සම්පිණ්ඩනයෙනි.
   (4) දීප්තිමත් හා අඳුරු වර්ණ එකිනෙකට මුසු කිරීමෙනි.
   (5) අවිනිශ්චිත හැඟීම් සමුදායෙන් හෙබි කාන්තා රූ මගිනි. (.........)


13. C රූපයේ දැක්වෙන වින්සන්ට් වැංගෝගේ 'තරු පිරි රැය' සිතුවම
   (1) රාත්‍රියේ ආලෝකයේ හැසිරීම සිතුවමට නැඟීමට ගත් උත්සාහයකි.
   (2) සැබෑ තත්ත්වයෙන් ඔබ්බට ගොස් භාවමය යථාර්ථය දැක්වීමට ගත් උත්සාහයකි.
   (3) මූලික වර්ණයන් තලය මත අවිධිමත්ව තැවරීම තුළින් කළ ප්‍රකාශනයකි.
   (4) වේගවත් බුරුසු පහරවල් තුළින් තේමාවේ යථාර්ථය මතුකිරීමට ගත් වෑයමකි.
   (5) අඳුර හා ආලෝකය සම්බන්ධතාවයෙන් යුතුව උපයෝගීකොට කළ ප්‍රකාශනයකි. (.........)


14. D රූපයේ දැක්වෙන එඩ්ගා ඩෙගාගේ 'හිස පීරන ස්ත්‍රිය' සිතුවමෙන් ශිල්පියා අවධාරණය කර ඇත්තේ,
   (1) පශ්චාත් උපස්ථිතිවාදී කලා ලක්ෂණ මතු කිරීමටයි.
   (2) පෞද්ගලික අනන්‍යතාවය සඟවා ක්‍රියාව අවධාරණය කිරීමටයි.
   (3) වේගවත් සහ නිදහස් පින්තාරු ශෛලිය ගෙන හැර දැක්වීමටයි.
   (4) ශරීරයේ ආකෘතිය සහ ශරීරාංග ආලෝකයට දක්වන ප්‍රතික්‍රියා නිරීක්ෂණයටයි.
   (5) හුදෙකලාව හා විවිධ මානසික ව්‍යාකූලතා පදනම් වූ භාව ප්‍රකාශනය දැක්වීමටයි. (.........)

15. E රූපයේ දැක්වෙන අයිවන් පීරිස් ගේ 'ආපසු ඒම' සිතුවම්කරණය සඳහා ලබා ඇති කලා ශෛලිය ආභාසය වනුයේ,
   (1) මොන්ඩ්‍රියන්ගේ හා එල් ග්‍රෙකෝගේ රූපමය ආභාසයයි.
   (2) පිකාසෝගේ හා ගොගැන්ගේ වියුක්ත හැඩතල ආභාසයයි.
   (3) සැල්වදෝර් ඩාලිගේ හා එල් ග්‍රෙකෝගේ හැඩතල භාවිතයයි.
   (4) සැල්වදෝර් ඩාලිගේ හා පිකාසෝගේ ඝනිකවාදී රූපමය ආභාසයයි
   (5) මොන්ඩ්‍රියන්ගේ හා ගොගැන්ගේ සිතුවම්වලින් ප්‍රකාශිත තල ආකෘතික ආභාසයයි. (.........)


● ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් යෝග්‍ය වරණය පහත සඳහන් F, G, H, I, J ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.


F


G


H


I


J

16. F කැටයමෙහි ප්‍රතාපවත්බව, චාම් ස්වභාවය හා දිගටි මානව හැඩතල හේතුවෙන් මෙය
   (1) කපිල ඍෂිවරයා නිරූපිත බව පැවසේ.
   (2) යුද සෙබලකු නිරූපිත යැයි සැලකේ.
   (3) වැස්සට අධිපති පර්ජන්‍ය දිව්‍ය සංකල්පය මතු කරයි.
   (4) පල්ලව කලා බලපෑම් ලැබූ නිර්මාණයකි.
   (5) ගුප්ත කලා ආභාසය සහිත නිර්මාණයකි. (.........)

17. G කැටයම වාස්තු විද්‍යාවේ ඇවමුවා නිර්මාණයක් වන මෙය
   (1) විකසිත නෙළුමක ස්වරූපය අනුව කරන ලද කැටයමකි.
   (2) කුළුණු හිස මත සිවිලෙසට විහිදුනු කලා අංගයකි.
   (3) කණු මත බාල්ක දරා සිටීම සඳහා සකසන ලද අංගයකි.
   (4) පැති හතර පහතට හැරවුණු නෙළුම් මල් මෝස්තරය යෙදූ අංගයකි.
   (5) දාරුමය වාස්තු විද්‍යාවේ දැකගත හැකි ජේකඩ නිර්මාණයකි. (.........)

18. H අක්ෂරයෙන් දැක්වෙන පුවරු කැටයම්
   (1) ජාතක කථා සිද්ධියක් නිරූපිත කැටයමකි.
   (2) සත්ත්වයකු බෝසත් චරිතය ලෙස භාවිත කිරීමකි.
   (3) බෝසත් චරිතය නිරූපිත අවස්ථාවකි.
   (4) අඛණ්ඩ කථනය භාවිත අර්ධ උන්නත පුවරු කැටයමකි.
   (5) අල්ප උන්නත පුවරු කැටයමක් භාවිතයෙන් ජාතක කතා පුවතක් ඉදිරිපත් කරයි. (.........)

19. I අක්ෂරයෙන් දැක්වෙන ආකාශ ගංගාව රෝහණ කැටයමේ ශිල්ප ක්‍රම හා ශෛලිය අනුව,
   (1) කතාන්දර කීමේ ස්වරූපය, ස්වාභාවිකවාදී ශෛලිය හා නිරූපණාත්මකබවින් යුතු කැටයමකි.
   (2) දකුණු ඉන්දීය කලාවේ ආවේණික කැටයම් ලක්ෂණ සහිත නිරූපණයකි.
   (3) මනුෂ්‍ය, සත්ත්ව හා කල්පිත රූප සහිත සමූහ සංරචනයකි.
   (4) පල්ලව කලා ලක්ෂණ සහිත කොටස් තුනකින් යුතු අර්ධ උන්නත ගල් කැටයමකි.
   (5) සමස්ත සංරචනයම ශෛලිගත ශෛලියෙන් හා ආඛ්‍යානගත ස්වරූපයෙන් යුක්තවේ. (.........)

20. J අක්ෂරයෙන් දැක්වෙන කුළුණු කැටයම
   (1) රෝම අධිරාජ්‍යයාගේ ඩේසියානු යුද සටන් දර්ශන ඇතුළත් ය.
   (2) ටයිටස් අධිරාජ්‍යයාගේ යුද ජයග්‍රහණ තේමා වූ නිර්මාණයකි.
   (3) ට්‍රැජන් අධිරාජ්‍යයාගේ ඩේසියානු යුද අවස්ථා නිරූපණය කළ අවස්ථාවකි.
   (4) යුද ජයග්‍රහණ අවස්ථා නිරූපිත රෝම වාස්තු විද්‍යාත්මක අංගයකි.
   (5) ඩොමිතියන් අධිරාජ්‍යයා විසින් ටයිටස් අධිරාජ්‍යයාගේ යුද ජයග්‍රහණ ස්මරණය සඳහා කළ නිර්මාණයකි. (.........)

● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට **වඩාත් ගැළපෙන** වරණය පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.



K



L



M



N



O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන තිස්ස රණසිංහයන්ගේ 'දුෂ්කර ක්‍රියාව' මූර්තියේ සංකල්පීය තේමාව වඩාත් තීව්‍රව ප්‍රකාශ කෙරෙනුයේ,
- (1) රළු වයනයෙන් ලැබෙන අඳුර හා ආලෝකය මගිනි.
- (2) වාත්තු කිරීම සඳහා ලෝකඩ භාවිත කළ හෙයිනි.
- (3) ආකෘතියේදී ස්වාභාවිකත්වය බැහැර කිරීම නිසාවෙනි.
- (4) ශරීරාංග අතිශයෝක්තියෙන් දැක්වීමෙනි.
- (5) යුරෝපීය නූතනවාදී මූර්ති කලාවේ ප්‍රයෝග භාවිත කිරීමෙනි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන ශිව සෝමස්කන්ධ මූර්තියෙන් සංකේතවත් වන්නේ,
- (1) ශිව සහ පාර්වතී දෙවියගේ විවාහ උත්සවයයි.
- (2) ස්ත්‍රී සහ පුරුෂ බලයන්ගේ සුසංයෝගයයි.
- (3) ශිව දෙවියන්ගේ බල පරාක්‍රමයයි.
- (4) ශිව සහ පාර්වතී දෙවියගේ දිව්‍යමය ප්‍රේමයයි.
- (5) පාර්වතී ශිව දෙවියන්ගේ පතිනිය බවයි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන කලා කෘතියේ මාතෘත්වය හැඟවීම සඳහා යොදාගත් දෘශ්‍යමය උපක්‍රම වඩාත් ඉස්මතු වන්නේ,
- (1) කාන්තාවකගේ ගැඩ ප්‍රාථමික මට්ටමින් නිරූපිත වෙරාකොටා මූර්තිය මගිනි.
- (2) ස්ත්‍රී ලක්ෂණ ප්‍රකට කරවන පළඳනා හා ඇඳුම් ආයිත්තම් මගිනි.
- (3) පුළුල් උකුල හා පූර්ණ පියයුරු මනාව නිරූපිත බැවිනි.
- (4) මල් ලියකම්වලින් අලංකෘත හිස් පළඳනා සහිත කාන්තා රූපය හේතුවෙනි.
- (5) ගෙල, අත්, පා හා උකුළ සරසන ලද ආභරණ නිරූපිත වන හෙයිනි. (.........)

**24.** **N** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය මගින් දෘශ්‍යමාන වන්නේ,
- (1) ගන්ධාර රාජකීයකුගේ පිළිරුවකි.
- (2) කණිෂ්ක රජු ප්‍රකාශිත ගන්ධාර මූර්තියකි.
- (3) කණිෂ්ක රජු ප්‍රකාශිත මථුරා මූර්තියකි.
- (4) ගන්ධාරයෙන් හමු වූ මානව කවන්ධ රුවකි.
- (5) මථුරාවෙන් හමු වූ කඩුවක් හා සෙංකෝලයක් දරණ රාජකීයෙකි. (.........)

**25.** **O** අක්ෂරයෙන් දැක්වෙන 'සමෝත්‍රාස්හි විජයග්‍රහණයේ දේවතාව' මූර්තියේ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
- (1) සම්භාව්‍ය යුගයේ පරමාදර්ශවාදය.
- (2) සම්භාව්‍ය යුගයේ භාව විෂයයිකබවයි.
- (3) හෙලනිස්ටික් යුගයේ ලාලිත්‍යයයි.
- (4) ග්‍රීක පෞරාණික යුගයේ කොන්තපොස්තෝ ආකෘතියයි.
- (5) හෙලනිස්ටික් යුගයේ ස්වාභාවිකවාදී ආභාසයයි. (.........)

ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** තෝරන්න.

26. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදයේ මූලික ලක්ෂණය වනුයේ,
(1) වස්තූන් හා ආලෝකය අතර සබඳතාව ප්‍රකාශ කිරීමයි.
(2) පර්යාවලෝක මූලධර්ම නිවැරදිව භාවිත කිරීමයි.
(3) ප්‍රශස්ත සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූපණයයි.
(4) යථා ලෝකයේ පවතින වස්තු විෂය තථ්‍යවාදීව නිරූපණය කිරීමයි.
(5) සෞන්දර්ය රීතීන් හා මූලධර්ම අනුගමනය කිරීමයි. (.........)

27. අධි තාත්ත්විකවාදය සඳහා පදනම වී ඇත්තේ,
(1) සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණ සිද්ධාන්තයන් ය.
(2) පළමු ලෝක යුද්ධයෙන් ඇති වූ අප්‍රසන්න අත්දැකීම් ය.
(3) අභ්‍යන්තර මනෝභාවයන්හි ඇති වැදගත්කම පිළිබඳ විශ්වාසයන් ය.
(4) අතාර්කිකත්වය, අහම්බ හා ආත්ම විවරණය වැනි තේමාවන් ය.
(5) සිත, කලාත්මක රූපක ගොඩනැගීමට වැදගත් යැයි විශ්වාස කිරීම ය. (.........)


28. වර්ණ කලා කෘතියක අර්ථ සම්පාදනයෙහිලා දායකත්වයක් සපයන නිවැරදි මූලධර්ම තුනක් දක්වා ඇති වරණය කුමක් ද?
(1) සුසංයෝගය, වයනය, අවකාශය
(2) වයනය, ආකෘතිය, රිද්මය
(3) සමානුපාතය, ත්‍රිමාණ ලක්ෂණ, වර්ණය
(4) සමබරතාවය, රිද්මය, පර්යාලෝකනය
(5) හැඩය, තේමාව, ඒකාග්‍රතාවය (.........)

29. මෝගල් චිත්‍ර කලාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වනුයේ,
(1) භූමි දර්ශන, දඩයම් දර්ශන හා රජ පවුලේ දර්ශන සිතුවම් කිරීමයි.
(2) ආගමික හා ඓතිහාසික තේමාවන් චිත්‍රනය කිරීමයි.
(3) පර්යාලෝක ලක්ෂණ හා සියුම් රේඛාකරණය දැක්වීමයි.
(4) පර්සියානුවන් හා මෝගල්වරුන් අතර සම්බන්ධතාව දැක්වීමයි.
(5) සමස්ත සම්පිණ්ඩනය මෝස්තරානුකූල බවක් ගැනීමයි. (.........)

30. භාරතයේ භාවාත්මක බුදු පිළිමයක් තෙළීමේ ගෞරවය හිමි වන්නේ,
(1) ගන්ධාර ශිල්පීන්ට ය.
(2) මථුරා ශිල්පීන්ට ය.
(3) සරානාත් ගුරු කුලයට ය.
(4) ගුප්ත සම්ප්‍රදායට ය.
(5) අමරාවතී ශිල්පීන්ට ය. (.........)


ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

31. මෙම ශෛලමය නෙළුම් පොකුණ




(1) ගල් වඩුවාගේ මාධ්‍ය භාවිතයේ ඇති ශිල්පීයත්වය පෙන්නුම් කළ නිර්මාණයකි.
(2) සොබා සෞන්දර්ය සංකල්ප හා නිර්මාණ කෞශල්‍යය එකට මුසුවූ අවස්ථාවකි.
(3) තාක්ෂණික මූලධර්ම ඔස්සේ සෞන්දර්යබව ප්‍රකාශිත නිර්මාණයකි.
(4) මහා පරාක්‍රමබාහු රජතුමාගේ තාක්ෂණික ඥානය විදහා දැක් වූ නිර්මාණයකි.
(5) ආලාහන පිරිවෙන්වාසී සංඝයා වහන්සේලා උදෙසා තනවන ලද්දකි. (.........)

32. මෙහි දැක්වෙන ජන්තාඝරය



(1) අරන්කැලේ ආරාමවාසී භික්ෂූන්හට ස්නානය සඳහා නිමවන ලද්දකි.
(2) අභයගිරියේ භික්ෂූන් වහන්සේලාට උණු පැන් සපයන ලද්දකි.
(3) මහා විහාර භූමියේ පිහිටි පූද පූජා සඳහා උණු පැන් සකසා ගැනීමට භාවිත කරන ලද්දකි.
(4) මිහින්තලයේ පිහිටි පහුලේ ගල් අකුරා ඖෂධ පැන් ස්නානයට සකසා ගන්නා ලද්දකි.
(5) රිටිගල පිහිටා ඇති උණුසුම් ජලය ස්නානය කිරීමේ පහසුකම් සහිත වූවකි. (.........)


33. පංච පාණ්ඩව රථ දෙවොල අතර ඇති 'දෞපදී රථ'



(1) චතුරස්‍රාකාර කුටියකින් සමන්විතයි.
(2) රථ දෙවොල අතුරෙන් සරල හා කුඩාම දෙවොලයි.
(3) හුදෙකලාව ඉදිකර ඇති දෙවොලයි.
(4) නිම නොකරන ලද දෙවොලකි.
(5) විස්තරාත්මක කැටයමකින් යුක්තයි.

(.........)


34. ඉන්දු නිම්නයෙන් හමු වූ නාන තටාකයේ ඇති සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිර්මාණ අංගය වන්නේ,



(1) එකිනෙක සම්මුඛ වූ පියගැටපෙළ ය.
(2) ජ්‍යාමිතික හැඩැති කුඩා කුටි ය.
(3) පෙරණයක් සහිත කාණු පද්ධතිය ය.
(4) ජල පරිවහන පැන්නුම් ආරුක්කුව ය.
(5) ප්‍රධාන දොරටුව අභියස ඇති කුඩා කුටිය ය.

(.........)


35. අබුසිම්බල් දේවස්ථානය නිර්මාණකරණයේ සුවිශේෂත්වය වනුයේ,



(1) සූර්ය දිව්‍ය සංකල්පයට අනුව ඉදිකරන ලද නිසා ය.
(2) ජ්‍යාමිතික හැඩ බහුලව යොදා ගත් දෙවොලක් නිසා ය.
(3) ගල් පර්වතයක් අභ්‍යන්තරයට හාරා කරන ලද දේවස්ථානයක් නිසා ය.
(4) නව රාජධානි යුගයේ ඉදි වූ දැවැන්ත දේවාල සංකීර්ණයක් නිසා ය.
(5) නයිල් ගංගාධාරයේ පිහිටි පර්වතයක් ආශ්‍රිතව ඉදිකරන ලද දෙවොලක් නිසා ය.

(.........)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම පුනරුද යුගයේ දී නිර්මාණය කරන ලද ශිල්පියා වූයේ,
(1) මයිකල් ඇංජලෝ ය.
(2) සැන්ඩ්‍රෝ බොටිචෙලි ය.
(3) ලියනාඩෝ ඩාවින්චි ය.
(4) රෆායෙල් සාන්සියෝ ය.
(5) ඇන්ඩ්‍රියා ඩෙල් වෙරොක්කියෝ ය. (.........)

**37.** මෙම සිතුවම දක්නට ලැබෙනුයේ,
(1) රෝමයේ සිස්ටයින් දෙව් මැදුර තුළ ය.
(2) රෝමයේ ශාන්ත පීතර දෙව් මැදුරේ ය.
(3) රෝමයේ ස්ටැන්සා ඩෙලා සිග්නතූරා මැදුර තුළ ය.
(4) ප්‍රංශයේ ලූව්ර් කෞතුකාගාරයේ ය.
(5) ඉතාලියේ ශාන්ත මරියා ඩෙලා ග්‍රෙසි තාපසාරාමයේ ය. (.........)

**38.** මෙම සිතුවම සඳහා තේමා වී ඇති සිද්ධිය හා අවස්ථාව ට සම්බන්ධිත වනුයේ,
(1) කාව්‍ය ශාස්ත්‍ර විෂයයයි.
(2) මානව ශාස්ත්‍ර විෂයයයි.
(3) දාර්ශනික ගුරුකුලයයි.
(4) විඥානවාදී විෂයයයි.
(5) භෞතිකවාදී ආකල්පයයි. (.........)

**39.** මෙම සිතුවම සංරචනයේ මූලික අරමුණ වූයේ,
(1) විවිධ මානව ශාස්ත්‍රඥයින් ඔවුන්ගේ කාර්යන්හි නිරත වන අයුරු විදහා දැක්වීමයි.
(2) විවිධ මතධාරීන්ගේ චර්යාවන් චිත්‍ර තලය මත දැක්වීමයි.
(3) මධ්‍යගත ගෘහ නිර්මාණ ආකෘතිය හා නිවැරදි පර්යාලෝක මූලධර්ම මත ඇඳ දැක්වීමයි.
(4) සවාප දර්ශනවාදීන් චිත්‍ර තලය පුරා අවිධිමත් ලෙස විසිරී යන ආකාරයට යෙදීමයි.
(5) වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා මානව රූප ඇසුරෙන් සිතුවම අදියර ගණනාවකට සැලසුම් කිරීමයි. (.........)

**40.** මෙම සිතුවම,
(1) ක්‍රියාකාරී මානව රූප විස්සකට අධික ප්‍රමාණයක් තලය මත හසුරුවා ඇති ආකාරය අනුව ශිල්පියාගේ පරිණතබව අගය කළ හැකි ය.
(2) ග්‍රීක දාර්ශනිකයින් සමූහය වටා ඇති වාස්තු විද්‍යාත්මක පසුතලය සම්පිණ්ඩනය කර ඇති ආකාරයෙන් ප්‍රකාශන අර්ථය තීව්‍ර කිරීමට හේතුවීම අගය කළ හැකි ය.
(3) විවිධ කාල වකවානුවලට අයත් පුද්ගල චරිත එකම තලයක සම්පිණ්ඩනය කිරීම තුළින් ප්‍රකාශන අර්ථය වඩාත් ඉස්මතු වීම අගය කළ හැකි ය.
(4) දැවැන්ත හා තේජාන්විත ගෘහ නිර්මාණ ආකෘතිය එහි සිටින ප්‍රාඥයින්ගේ දැනුම හා ගාම්භීරත්වය අවධාරණයට ආධාරක බලපෑමක් වීම අගය කළ හැකි ය.
(5) කේන්ද්‍රීය චරිත මධ්‍යගතවන සේ යෙදීමෙන් ඔවුන්ගේ එකිනෙකා ප්‍රතිවිරුද්ධ මතවාද සංකේතානුසාරීව දැක්වීමට ගත් උත්සාහය මගින් ප්‍රකාශනයේ අර්ථය තීව්‍ර වීම අගය කළ හැකි ය. (.........)

* *

Downloaded from 'Past Papers Wiki'

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### 'අ' කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර යුගයේ බිහිවූ කලා නිර්මාණ අතර බුදු පිළිමය අද්විතීය කලා නිර්මාණයකි.
   (i) ශ්‍රී ලංකාවේ බුදුපිළිම නිර්මාණය සඳහා ලැබී ඇති ඉන්දීය කලා ආභාස **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) පන්කුලිය පිළිමයේ බාහිර ලක්ෂණ ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) 'මහඉලුප්පල්ලම පිළිමය' හා 'අවුකන පිළිමය' අතර පවත්නා සබඳතාව, ඉරියව්ව, මාධ්‍ය භාවිතය, මුද්‍රා හා ආභාසය ඇසුරින් තුලනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 8 යි.)

2. ශ්‍රී ලංකාවේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව වෙනුවට 18 වන සියවසේ දී මහනුවර චිත්‍ර සම්ප්‍රදාය ලෙස නව කලා ආරක් බිහිවූ අතර, පසුව එය පහතරට ප්‍රදේශ කරා ද පැතිර ගියේ ය.
   (i) මහනුවර යුගයේ ශිල්පීන්ට පාදක වූ ශෛලීය ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) දඹුල්ල විහාරයේ 'අනෝතත්ත විල' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) මහනුවර සම්ප්‍රදායේ පහතරට ශෛලිය අනුව චිත්‍රණය වූ මුල්කිරිගල විහාරයේ තේලපත්ත ජාතකයේ 'ශ්‍රවණේන්ද්‍රිය ආකර්ෂණය කරයි'(සංගීතකරුවන්) නම් සිතුවම හා කතලුව පූර්වාරාමයේ මහාධන සිටුවරයා කථාවේ 'සංගීතය සහ විනෝද වීම' නම් සිතුවම අතර පවතින වස්තු විෂය, අවකාශ භාවිතය, වර්ණ භාවිතය, සංරචනය පිළිබඳ සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 8 යි.)

3. ශ්‍රී ලංකාවේ පුරාණයේ සිටම පැවති කලා කර්මාන්තයක් ලෙස ලෝහ කලා නිර්මාණ සැලකිය හැකි ය.
   (i) 'මාලාකාරා' මූර්තිය නිර්මාණය කර ඇති මාධ්‍ය හා ශිල්පක්‍රමය නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) 'අවලෝකිතේශ්වර' බෝධිසත්ත්ව ප්‍රතිමාව ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) 'ඇදිගම කොටවෙහෙරෙන් හමු වූ ඇත් පහන විදග්ධාත්මක සංසිද්ධියක් පදනම් කොට ගෙන නිර්මාණය වූවකි.' ඒ පිළිබඳව මාධ්‍ය භාවිතය, ආකෘතිය, තාක්ෂණික ක්‍රමය හා නිමාව අළලා ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

## 'ආ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. මෞර්ය යුගයේ ඇරඹි බෞද්ධ කලාව ගුරුකුල කිහිපයක් ඔස්සේ වර්ධනය විය.

   (i) කණිෂ්ක රාජ අවධියේ දී බෞද්ධ කලාවේ උන්නතියට දායක වූ ගුරුකුල **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) සාරානාත් ස්ථම්භ ශීර්ෂය ගැන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5 යි.)

   (iii) භාරුත් හි 'ජේතවනය පිදීම' හා අමරාවතී හි 'නාලාගිරි දමනය' යන කැටයම් දෙකෙහි සිද්ධි නිරූපණය හා ශිල්පීය කුසලතා පදනම් කරගෙන සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

5. පල්ලව කලා සම්ප්‍රදායෙන් පසුව බිහි වූ චෝල කලා සම්ප්‍රදාය තුළ වාස්තු විද්‍යාව මෙන්ම මූර්ති කලාව එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණ සහිතව වර්ධනය වී තිබේ.

   (i) පල්ලව වාස්තු විද්‍යා නිර්මාණ අතර දක්නට ලැබෙන ප්‍රධාන වාස්තු විද්‍යා ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) වෛරළේ දේවාලය පිළිබඳව කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 5 යි.)

   (iii) 'කල්‍යාණ සුන්දර' මූර්තිය පිළිබඳව අන්තර්ගතය, මාධ්‍ය, ආකෘතිය හා කලාත්මක අගය අළලා ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. 19 වැනි සියවසේ යුරෝපයේ චිත්‍ර කලාකරුවන් කළ නව අත්හදා බැලීම්, සිතුවම් කලාවේ විවිධ අනුවාද රැසක් බිහිවීමට හේතු විය.

   (i) පැවැති ප්‍රංශ සැලෝනයට එරෙහිව ක්‍රියා කළ ශිල්පීන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයට සමගාමීව නිර්මාණකරණයේ යෙදුණු ඔගුස්ට් රොඩෑංගේ ශිල්පියාගේ 'කැලේ' (Calais) නම් සමූහ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

   (iii) පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියකු වූ පෝල් සෙසාන්ගේ 'ඉරි තැලුණු බිත්ති සහිත නිවස' (The house with the cracked walls) හා ඝනිකවාදී චිත්‍ර ශිල්පී ජෝර්ජ් බ්‍රාක් ගේ 'නිවාස හා ගස්' (Houses and Trees) යන සිතුවම් දෙක පිළිබඳ සම්පිණ්ඩනය, ආකෘතිය, වර්ණ භාවිතය, නිමාව ඇසුරෙන් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 8 යි.)

7. රෝමය වාස්තු විද්‍යාව හා මූර්ති කලාව අතින් ඉතා දියුණුවට පත් වූ රාජ්‍යයකි.

   (i) විජයග්‍රහණ ආරුක්කු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) 'කරකැල්ලා (Cracalla) චිද්ධ මූර්තිය' (උඩුකය මූර්තිය) පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

   (iii) රෝම වාස්තු විද්‍යාවේ සියලුම ගුණයන් නියෝජනය වන පරිදි නිර්මාණය කළ කලෝසියම්, ඇම්ෆිතියටරය ආකෘතිය, වාස්තු විද්‍යා ලක්ෂණ භාවිතය හා නූතන තත්ත්වය ඇතුළත් විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න